# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த.பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 598/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 07/04/2024 පැය 0755

## මාධ්‍ය නිවේදනය

**පොලිස් නිලධාරීන්ට තියුණු ආයුධ වලින් පහරදුන් සැකකරුවෙකු පොලිස් වෙඩි පහරින් මියයාම - මාවනැල්ල පොලිස් වසම.**

2024.04.06 වන දින රාත්‍රී කාලයේදී මාවනැල්ල පොලිස් වසමේ පදියදොර ප්‍රදේශයේ තියුණු ආයුධ රැගත් පුද්ගලයින් දෙදෙනෙකු කලහකාරී ලෙස හැසිරෙමින් එම ප්‍රදේශයේ ඉඩමකට අයුතු ලෙස ඇතුළු වී නිවසකට ගල්වලින් පහරදීම් සිදුකරන බවට හා මරණ තර්ජනය කරන බවට මාවනැල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව මාවනැල්ල පොලිස් ස්ථානයේ 119 යතුරු පැදි සංචාරය හා රාත්‍රී ජංගම සංචාරයේ යෙදී සිටි නිලධාරින් එම ප්‍රදේශයට ගොස් ඇත.

එහිදී කලහකාරී ලෙස හැසිරෙමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු විසින් 119 යතුරු පැදි සංචාරයේ නිලධාරින් දෙදෙනාට කඩුවලින් පහරදී බරපතල තුවාල සිදුකර ඇත. එම අවස්ථාවේ නිලධාරින් දෙදෙනාගේ ජීවිත ආරක්ෂා කරගැනිම සඳහා ජංගම සංචාර නිලධාරින් විසින් සැකකරුවන්ට වෙඩි තැබීමක් සිදුකර ඇති අතර වෙඩි වැදීමෙන් කලහකාරී ලෙස හැසිරෙමින් සිටි එක් පුද්ගලයෙකු තුවාල ලබා ඇත. ඔහුගේ පුතා බවට හඳුනාගෙන ඇති අනෙක් පුද්ගලයා එම ස්ථානයෙන් පලාගොස් ඇත. තුවාල ලැබූ පොලිස් නිලධාරින් දෙදෙනා සහ සැකකරු ප්‍රතිකාර සඳහා මාවනැල්ල රෝහලට ඇතුළත් කිරීමෙන් පසු සැකකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වන පදියදොර, මැවනැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය සැකකරු මාවනැල්ල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය හා නීති විරෝධී මත්පැන් ජාවාරම් සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම පොලිස් අත්අඩංගුවට පත්වූ අයෙකු වන අතර වයස අවුරුදු 24ක්වූ අනෙක් සැකකරුද මත්ද්‍රව්‍ය චෝදනා සහ ජීව අත්බෝම්බයක් සන්තකයේ තබාගැනීම සම්බන්ධව බන්ධනාගාර ගතව සිට දැනට සතියකට පමණ ඉහත ඇප මත නිදහස්ව පැමිණි අයෙකු වේ.

තුවාල ලැබූ නිලධාරින් දෙදෙනා මේ වන විට මාවනැල්ල රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන අතර මියගිය සැකකරුගේ මෘත ශරීරය මාවනැල්ල රෝහලේ

මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**